# <u>හෙළ හවුලේ පනත</u>

1) <u>නම</u> :- හෙළ හවුල යනු මේ එකතුවේ නම යැ.

2) <u>අරමුණ</u> :- හෙළ හවුල වනාහි රජය ,සමය,දෙස්පලුව යන විසින් කිසි බෙදීමක් නැති,හුදෙක් හැදියාව සඳහාම වූ එකතුවෙකි. හෙළ බසත් , එමගින් හෙළ රැසත් ඉන් මැ හෙළ දෙසත් වැඩීම යැ මෙහි අරමුණ.එබැවින් හෙළ හවුලේ කටයුතු පහත සඳහන් අයුරින් වෙයි:-

2.1. හෙළ ලිවියැරිය, හෙළ සගයුව, හෙළ සිත්තම ඈ කලාවන් රැකීම, වැඩීම ,වැවීම.

2.2. පැරණි - නව සොයුනතු අදහස් ආදී සියලු පෙර අපර දසුන් ද හෙළ බසින් පහළ කිරීම.

2.3.රැසේ වුවමනාවන් සඳහා බස යෙදැවීම.

3) <u>ඇතුළත් බව</u> :-හෙළ හවුලේ අරමුණු පිළිගන්නට රිසි හැම දෙනමැ ඇතුළත් බවට නිස්සෝ යැ.

ඇතුළත්හු,

3.1. ~~ඈ~~සෑමැණි ඇතුළත් හූ යැ.

3.2. සිසු ඇතුළත් හූ යැ යි දෙ වගෙකි.

4) ඇතුළත් බව පතා එන ඉලියුම් පත් සැලකීම ද, ඒ සඳහා පැවරිය යුත්තේ කිනම් ඇතුළත් වගෙක් දැයි නිනැයීම ද විදහන් කමිටුව සතු යැ.ඇතුළත් බව තිර වන්නේ විදහන් කමිටුවේ ඒ අනුමැතිය මහ මඬුල්ලේ අනු දැන්ම ලත් විටැයි.

5) මහ මඬුල්ල:- හෙළ හවුලේ පිලිවෙත පහදා නිනැයෙන්නේ මහ මඬුල්ලෙනි. මෙ මඬුල්ල හෙළ හවුලේ නායුවා ද අනු නායුවන් සිව් දෙන ද සකසුරුවන් දෙදෙනෙකුත් ද තවත් විසි එක් දෙනෙකුත් ද යන ඇතුළතුන් විසි නව දෙනාගෙන් සැදෙයි.

නව මහ මඬුල්ලක් සඳහා මඬුලු ඇතුළතුන් ද ඔවුන් අතුරෙන් නිලදරුවන් ද නම් කැරුම පවත්නා මහ මඬුල්ල සතු යැ. එහි නම් ,මහ මඬුල්ල විසින් අවුරුදු මුළුවේ දැනුම සඳහා ඉදිරිපත් කළ යුතුයි.

6) විදහන් කමිටුව :- මහ මඬුල්ල විසින් ඉදිරිපත් කැරෙන පිළවෙතට විරිද්ධ නො වන සැටියෙන් හෙළ හවුලේ කටයුතු නිනයා මෙහෙය වෙන්නේ විදහන් කමිටුවෙනි. මේ විදහන් කමිටුව හෙළ හවුල් නායුවා ද අනු නායුවන් සිවු දෙනා ද, සකසුරුවන් දෙදෙනා ද අයකැමි ද තවත් තුන් දෙනෙකුන් ද යන කමිටු ඇතුළතුන් එකොළොස් දෙනාගෙන් සැදෙයි.

නව විදහන් කමිටුවක් සඳහා කමිටු ඇතුළතුන් ගේ නම් එකොළොසක් මහ මඬුල්ල විසින් අවුරුදු මුළුවේ දී සැලැකැවියැ යුතු යැ. අවුරුදු මුළුවේ ඇත්තන් විසින් නව ද නම් ඉදිරිපත් නොකළහොත් මහ මඬුල්ල විසින් පැළැකැවුණු අය කමිටු ඇතුළතුන් සේ පත්වෙති. අවුරුදු මුළුවේ ඇත්තන් නව ද නම් සලකවා තිර කළහොත් ඒ නම් වෙනුවෙන් ද මහ මඬුල්ල විසින් සැළැකැවුණු නම් වෙනුවෙන් ද අවුරදු මුළුවේ සැඳ විමසා කමිටු ඇතුළතුන් තෝරා පත් කර ගත යුතුය.

සකසුරුවනට නො දන්වා එක දිගට කමිටු මුළු තුනකට නො පැමිණෙන්නෙකු ගේ විදහන් කමිටු ඇතුළත් බව නැති වේ.

7) හෙළ හවුලේ ගණන් හිලවු පිරික්සීම සඳහා ගණන් පිරික්සුවෙක් සිටිය යුත්තේ යැ.මඬුලු ඇතුළතකු හෝ කමිටු ඇතුළතකු හෝ නොවන හෙළ හවුලේ ඇතුළතකු ගණන් පිරික්සුවකු ලෙසැ අවුරුදු මුළුවේ දී තෝරා පත් කර ගත යුතු යි.

අවුරුදු අය වැය පැවැත්ම සහතික කැරුවත් , හෙළ හවුලේ ගිණුම් පත පොත තැබීමේ අඩුපාඩු ඇතොත් විදහන් කමිටුවට සැළකිරීමත් ගණන් පිරික්සුවා සතු වගකීම යැ.

III ඇතුළත් පතන්නවුන් ගේ නම්, කමිටුව විසින් ඉදිරිපත් කැරුණ විටැ,
ඒ නම් පිළිකෙවුම හෝ අනුදැනුම

IV.කමිටුව විසින් ඉදිරිපත් කැරෙන අවුරුදු සැළය ද අය වැය පැවැස්ම පිළි ගැනුම
V. නව මඬුලු ඇතුලතුන් නම් කැරුම .

V.I නව කමිටු ඇතුලතුන් ගේ නම අවුරුදු මුළුවට සැලැකැවීම.

VII. හෙළ හවුල වෙනුවෙන් කැරෙන ජන පැවසුම් හෙළ හවුලේ සකසුරුවන්
නමින් රටට දීම.

VIII. ඇතුළතුන් ගේ නොමනා හැසිරීම පිළිබඳ වැ කමිටුව ඉදිරිපත් කරන සැලය
සලකා බලා නිසි පියවර ගැනීම.

IX. හෙළ හවුලේ නිලයන් දරන තැනැත්තෙකු හෙළ හවුල් මතට නොගැලපෙන හැසිරීම නිසා හෝ නිල කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම නිසා හෝ එවන් වෙනත් දෙයක් නිසා හෝ ඒ නිලයෙන් ඔහු ඉවත් කිරීම.

X. මහ මඬුල්ලේ ඇතුළතකුගේ හෝ නිල දරුවකුගේ හෝ නිල කල තුළැ දී ඇතිවන හිස්තැන් පිරවීම.

XI. කමිටු ඇතුළතකු ගේ ගණන් පිරික්සුවා ගේ හෝ නිළ කල තුලැ දී ඇති වන හිස් තැන් පිරවීම.

9.2

<u>විදහන් කමිටු මුළු:-</u>

විදහන් කමිටු මුළුව යටත් පිරිසෙයින් මසකට වරක් හවුල් සකසුරුවන් විසින් කැඳැවිය යුතු යැ. එහි ගණ පූරුව පස් දෙනෙකි.

XI අතු හවුල් පැවැත්වීම.

9.3. සැමැනි මුළු:-

හෙල හවුලේ ඇතුළතුනට ද බැහැරියනට ද එක සේ ඇරුණු හෙළ හවුලේ අරමුණු ඉටු කැරුම් වස් සැමැනි මුළු, විදහන් කමිටුවට කැඳැවියැ හැක්කැ.එහි ගණ පුවරුව දස දෙනෙකි.

9.4 වෙසෙසි මුළු:-

හෙළ හවුලට අයත් කිසියම් කරුණෙක් පහයා ගැනීම සඳහා යටත් පිරිසෙයින් ඇතුළතුන් දස දෙනෙකුන් විසින් කරුණු ගෙන හැර දක්වමින් වෙසෙසි මුළුවක් මුළු දෙවන සේ ලියැවි ල්ලකින් හෙළ හවුල් නයුවාගෙන් ඉල්ලූ විටැ වෙසෙසි මුළුවත් සකසුරුවන් විසින් කැඳවිය යුතු යැ.එහි ගණ පුවරුව පහළොස් දෙනෙකි.

ජන මුළුව:- දෙසුවන් කීප පලකගේ අදහස් හුවමාරුව සඳහා ඇතුළතුන්ට ද බැහැරියනට ද එකසේ ඇරුණු මූළුව ,ජන මුළුව ලෙසින් හැඳින්වේ.ජන මුළු පැවැත්වීමේ බලය විදහන් කමිටුව සතු යැ.

9.6 අවුරුදු මුළුව:-

නව නිලදරුවන් තිර කැර ගැන්ම,අයවැය පැවැත්ම තිර කර ගැන්ම ඈ දේ සඳහා
අගෝස්තු මස දී හවුල් සකසුරුවන් විසින් යටත් පිරිසෙයින් දෙසතියක් කල් දීඅවුරුදු
මූළුවක් කැඳැවිය යුතු යැ. එහි ගණ පූවරුව පසළොස් දෙනෙකි.

9.7. සමරු මුළු:-

හෙළ නයුවකු සමරනු සඳහා සමරු මුළුවක් කැඳවීමේ බලය හවුල් සකසුරුවන් සතු යැ. මාරතු දෙ වෙනි දාට යෙදෙන කුමරුතුඟු සමරුව ඔවුන් විසින් කැඳැවිය යුතු මැ යි.එ වන් සමරු මුළුවෙකැ දී,ගුණ වැනුම, ගැයුම හෝ ඒ සැමරෙන නයුවා නමින් වැදගත් ඉසව්වක් යටතේ හරබර දෙසුම් පැවැත්වීම හෝ යෙදේ.

9.8. මුළුවේ හැසුරුම:-

ඉහත සඳහන් හැම මුළුවක් සමුළුවක් ස දෙනා මැ මුළු නායු බව පැවරිය යුත්තේ හෙළ හවුල් නායුවාට හෝ අනු නායුවකුට යැ.

10. පනත වෙනස් කිරීම :-

මේ පනතේ කවර හෝ වෙනසක් කළ හැක්කේ අවුරුදු මුළුවෙකැ පැමිණ සිටුනා ඇතුළතුන් ගෙන් තුනෙන් දෙකක සැඳ ලබා ගැනීමෙනි.එවන් වෙනසක් කරන්නට ඇවැසි වූ විටෙකැ ඒ සඳහා කැරෙන සැලැකැවීම යටත් පිරිසෙයින් තෙ සතියකට කලින් විදහන් කමිටුවට දැන්විය යුතු යැ.

8) <u>නිල තල</u>:- මඩුලු ඇතුළතුන් ගේ ද, කම්ටු ඇතුළතුන් ගේ ද ගණන් පිරික්සුවාගේ ද නිල කල අවුරුදු මුළුවෙකැ සිට ඉක්බිති අවුරුදු මුළුව තෙක් වේ. නිළ කල අවුරුදූ මුළුවෙකැ සිටි ඉක්බිති අවුරුදූ මුළුව තෙක් වේ. නිල කල තුළැ මහ මඩුල්ලේ හෝ විදහන් කම්ටුවේ හෝ ගණන් පිරික්සු තනතුරෙහි හෝ තැනක් හිස් වුවහොත් පිරවීම මහ මඩුල්ල සතු යැ.

9) <u>මුළු දෙවුම</u>:- හෙළ හවුලට අයත් මුළු දෙවුම් සත් වගෙක් වේ. එනම් :-

1.මහ මඩුලු මුළු

2.විදහන් කම්ටු මුළු

3.සැමැනි මුළු

4.වෙසෙසි මුළු

5.ජන මුළු

6.අවුරුදු මුළු

7.සමරු මුළු

9.1. <u>මහ මඩුලු මුළුව</u>

මහ මඩුලු මුළුව යටත් පිරිසෙයින් තෙමසකට වරක් මඩුලු සකසුරුවන් විසින් කැඳැවිය යුතු යැ. එහි ගණ පුරුව හත් දෙනෙකි.

<u>බලතල:-</u>

I හෙළ හවුලේ පිලිවෙත පහදා නිනැයීම.

II විනයනය.

බලතල:-

I. හෙළ හවුලේ අරමුණු ඉටු කරනු වස් ඇවැසි සියළු පියවර ගැනීම.

II. වෙසෙසි කටයුතු සඳහා අනු කමිටු පිහිටු වීම.

III. ඇතුලත් බව පතන ඉලියුම් පිරික්සා සිය අදහස් මහ මඬුල්ලට ඉදිරිපත් කිරීම.

IV. ඇතුළත් මුදල නියම කරුට ද ඒ ලබා ගැනීම ද අනෙක් මංවලින් මුදල් උපයා ගැනීම ද එසේ ලබා ගන්නා මුදල් හෙළ හවුලේ බැංකු ගිණුමට නොපමාවැ බැර කළ යුතු යැ.

V. හෙළ හවුලේ කටයුතු සඳහා හෙළ හවුලේ මුදල් වැය කැරුම(කිසියම් විටෙකැ හෙළ හවුලේ මුදල් කිසිවෙකු ළඟැ කාසි වශයෙන් රුපියල් දෙසියයකට වැඩියෙන් නො තබා ගත යුතුයි.)

VI. කුමරුකුඟු සමරු උළෙල සවිදහන ද මෙහෙයැ වීම ද.

VII. හැම වසරේ මැ අගෝස්තු මසැ දී යටත් පිරිසෙයින් දෙ සතියක් කල් දී අවුරුදු මුළුව කැඳැවීම ( ගණන් පිරික්සුවා විසින් සහතික කැරුණු අයවැය පැවැස්ම ද සකසුරුවන් ගේ සැළය ද අවුරුදු මුළුවට සැම සකසුරුවන් ගේ වගකීම යි.)

VIII. හෙළ හවුලේ ඇතුළතකු පනතට හෝ පිළිවෙතට හෝ පටහැනි වැ කටයුතු කරන බවට පැමිණිල්ලක් ලද වහා ඒ ගැනැ සොයා බලා සිය අදහස මහ මඬුල්ලට පෑම.

IX විදහන් කමිටුවේ නිලදරුවකු ගේ නිල කල තුළැ දී ඇති වන හිස් තැන පිරුවීම.

X "සුබස" පැවැත්වීම.